# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් සහ අවම නාගරික පහසුකම් ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට මානව ජනාවාස සංවර්ධන ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත සඳහන් පුරප්පාඩු තනතුර සඳහා ස්ථිර පදනමින්/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ පොදු සුදුසුකම්**

**සෑම අපේක්ෂකයෙකුම :**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

ඇ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

| ස්ථිර පදනම | | |
|---|---|---|
| තනතුර | වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | MM 1-1 | 01 |

| කොන්ත්‍රාත් පදනම | |
|---|---|
| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
| අධ්‍යක්ෂ (මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය) | 01 |
| ගෘහ නිර්මාණ ශිල්පී | 01 |
| ඉංජිනේරු (සිවිල්/ විදුලි/ සේවා) | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් පරිපාලන) | 01 |
| නගර සැලසුම්කරු | 01 |
| කණිෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක | 02 |
| තාක්ෂණ නිලධාරී (සැලසුම් ශිල්පී) | 01 |

### සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යාව/ සංඛ්‍යානය/ තොරතුරු තාක්ෂණය/ දේපළ කළමනාකරණය/ නගර හා ග්‍රාම නිර්මාණ/ පරිගණක/ කළමනාකරණ/ ආර්ථික විද්‍යාව පිළිබඳව ලබාගත් ප්‍රථම උපාධිය

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03)ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු. 45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575 |
| දීමනා | ජීවන වියදම් දීමනා, ගැලපුම් දීමනා හා තනතුරට හිමි අනෙකුත් දීමනා |

### අධ්‍යක්ෂ (මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය) - කොන්ත්‍රාත්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක්

හෝ

ආශ්‍රිත සාමාජිකත්වය/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ රජයේ හෝ රාජ්‍ය ආයතනයක I ශ්‍රේණියේ නිලධාරියෙක් වීම

සහ

කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. එයින් අවුරුදු 05ක් පිළිගත් ව්‍යාපෘතියක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සුදුසුකම් තිබීම.

**වයස :** අවු: 35 ට නොඅඩු හා අවු. 55ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 80,295 + 7,800 = 88,095/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### ගෘහ නිර්මාණ ශිල්පී - කොන්ත්‍රාත්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිය ලබා තිබීම

සමග

අවම වශයෙන් අවුරුදු 05 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු.45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 55,925 + 7,800 = 63,725/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### ඉංජිනේරු (සිවිල්/ විදුලි/ සේවා) - කොන්ත්‍රාත්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු/ විදුලි ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

සමග

අවම වශයෙන් අවුරුදු 05 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු: 45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 55,925 + 7,800 = 63,725/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් පරිපාලන)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධිය ලබා තිබීම

සමග

අවම වශයෙන් අවුරුදු 04 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු:22 ට නො අඩු හා අවු:45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 53,175 + 7,800 = 60,975/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### නගර සැලසුම්කරු - කොන්ත්‍රාත්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නගර හා රට සැලසුම්කරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු: 45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 42,600 + 7,800 = 50,400/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### කණිෂ්ඨ ප්‍රමාණ සමීක්ෂණ - කොන්ත්‍රාත්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 6 වන මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 5 වන මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු.45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 42,600 + 7,800 = 50,400/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

### තාක්ෂණ නිලධාරී (සැලසුම් ශිල්පී) - කොන්ත්‍රාත්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 6 වන මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 5වන මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු: 22 ට නො අඩු හා අවු.45 ට නොවැඩි අයවිය යුතුය.

| | |
|---|---|
| මාසික දීමනාව | රු. 42,600 + 7,800 = 50,400/- |
| දීමනා | අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා |

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සතුවේ. දැනට රාජ්‍ය සංස්ථා ව්‍යාවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අයට වයස් සීමාව බලනොපාන අතර, ඔවුන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමු කළ යුතු ය.

මේ සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් **2021.08.02** වන දින හෝ ඊට ප්‍රථම www.usda.gov.lk වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත් පෝරමය සම්පූර්ණ කරන්න. නිසි පරිදි සම්පූර්ණ කරන ලද පෝරමය අප වෙත යොමු කිරීමෙන් (Submit) අනතුරුව ඒ පිළිබඳ තහවුරු කිරීමේ පණිවිඩයක් ස්වයංක්‍රීයව ඔබ වෙත යොමු වෙනු ඇත.

මෙම ක්‍රියාවලිය මාර්ග ගත තාක්ෂණය ඔස්සේ පමණක් සිදුකිරීමට සිදුව ඇති බව සළකන්න.


**සභාපති**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**
**09 වන මහල, සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**

**දුරකතන : 011-2887721  ෆැක්ස් : 011-2887721  ඊමේල් : admnusda@gmail.com**